# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 11 ශ්‍රේණිය

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I** **කාලය :** පැය 1

**සැලකිය යුතුයි.**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

1. ප්‍රාග් ඓතිහාසික යුගයේ සන්නිවේදන ක්‍රමයක් නොවන්නේ,
   1. මුවින් නිකුත්වන හඬ
   2. ශරීර අංගචලන
   3. කථන උපකරණ භාවිතය
   4. ඉරියව් හා ඉඟි

2. රූපාක්ෂර නිර්මාණය වීම සඳහා බලපෑ හේතුවක් නොවන්නේ,
   1. ගුහා චිත්‍ර ඇඳීම
   2. විවිධ රූප යොදා අක්ෂර නිර්මාණය
   3. අක්ෂරය හඬක් මගින් ඉදිරිපත් කිරීම
   4. අක්ෂරයකින් හඬක් වෙනුවට අදහසක් ඉදිරිපත් කිරීම

3. අර්ථ බාධකයට උදාහරණයක් වන්නේ,
   1. දුරකථන සංඥා ඇනහිටීම
   2. ග්‍රාහකයා නොදන්නා භාෂාවකින් ලිපියක් ලැබීම
   3. විදුලි බලය ඇනහිටීම
   4. පරිසරයේ වෙනස්වීම්

4. මේ අතරින් සමූහ සන්නිවේදනය සඳහා වඩා යෝග්‍ය උපක්‍රමය වන්නේ,
   1. සරල භාෂාව සහ ප්‍රදීපාගාර උපක්‍රමය
   2. තාක්ෂණික උපකරණ හා මිශ්‍ර භාෂාවයි
   3. පංච ඉන්ද්‍රියන් හා සරල භාෂාවයි
   4. කථන උපකරණ හා භාව ප්‍රකාශනයයි

5. මේ අතුරින් සන්නිවේදනයේ ගමන් මග වඩා සරලව හා රූපාකාරව දැක්වෙන්නේ,
   1. ෂැනොන් - වීවර් ආකෘතියෙනි
   2. යටිකුරු පිරමීඩ න්‍යායෙනි
   3. ලැස්වෙල්ගේ ආකෘතියෙනි
   4. චක්‍රීය ආකෘතියෙනි

6. දොරටුපාල සංකල්පය භාවිතා වීමට හේතුවක් නොවන්නේ,
   1. සන්දේශය ඉක්මනින් යැවීම
   2. ජන මාධ්‍යයේ සමාජීය වගකීම්
   3. මාධ්‍ය ආයතනයේ අරමුණු
   4. සමාජ සුරක්ෂිතතාවය

7. පුවත්පතක කතුවැකිය ලිවීමේ වගකීම දරන්නේ,
   1. සංස්කාරක කර්තෘ
   2. ප්‍රධාන කර්තෘ
   3. නියෝජ්‍ය කර්තෘ
   4. උප කර්තෘ

8. පහත සඳහන් ප්‍රකාශ අතරින් පුද්ගලාන්තර සන්නිවේදන අවස්ථාවක් නොවන්නේ,
   1. කෙටි පණිවිඩ යැවීම
   2. ලිපියක් යැවීම
   3. අතට අත දීම
   4. විද්‍යුත් තැපැල් ගිණුමක් ආරම්භ කිරීම

9. ලංකාවට ගුවන් විදුලිය හඳුන්වා දීමෙහිලා පුරෝගාමී සේවයක් සිදුකළේ,
   1. ශ්‍රීමත් හියු ක්ලිෆඩ් මහතා
   2. ඩී.ඇම්. කොළඹගේ මහතා
   3. එඩ්වඩ් හාපර් මහතා
   4. සර් විලියම් හෙන්රි මහතා

10. ජපන් රජයේ පරිත්‍යාගයක් ලෙස 1982 දී මෙරටට හිමි වූ ජනමාධ්‍ය ආයතනය වන්නේ,
   1. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවයි
   2. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවයි
   3. ස්වාධීන රූපවාහිනී සේවයයි
   4. සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමයි.

11. භාෂා ද්විරූපතාව යනු,
   1. භාෂාවේ ඇති අර්ථ හා යෙදුම්
   2. ප්‍රධාන භාෂා හා උප භාෂා පැවතීම
   3. වාචික හා ලිඛිත ලෙස භාෂාව පැවතීම
   4. භාෂා දෙකක් පැවතීම

12. පරිගණක මුද්‍රණ යන්ත්‍ර වර්ගයක් නොවන්නේ,
   1. ලේසර් මුද්‍රණ යන්ත්‍රය
   2. ඩිජිටල් අනුපිටපත්කරණ යන්ත්‍රය
   3. ඩොට් මුද්‍රණ යන්ත්‍රය
   4. ඉන්ක්ජෙට් මුද්‍රණ යන්ත්‍රය

13. ''දෑස් නොපෙනෙන සිසුවා උසස්පෙළින් දිස්ත්‍රික් ප්‍රථම ස්ථානයට'' මෙය,
   1. මෘදු පුවතකි
   2. දෘඩ පුවතකි
   3. සංවේදී පුවතකි
   4. ප්‍රාදේශීය පුවතකි

14. ආයතනයක යෝජනා පෙට්ටි පවත්වාගෙන යාම තුළින් කුමන සන්නිවේදනයක් නිරූපිතද?
   1. ඉහළ සිට පහළට සන්නිවේදනය
   2. තිරස් සන්නිවේදනය
   3. කණ්ඩායම් සන්නිවේදනය
   4. පහළ සිට ඉහළට සන්නිවේදනය

15. ගුවන් විදුලිය සතු ප්‍රබලතාවයකි.
   1. සාක්ෂරතා වර්ධනය
   2. පරිකල්පනීය හැකියාව
   3. වියත් වහරක් යොදාගැනීම
   4. ආකර්ශනීයම මාධ්‍යය වීම

16. පාරේ ගමන් කරමින් සිටි සමන් එක් වරම නැගුණු තිරිංග හඬින් තිගැස්සී පාරෙන් ඉවතට පැන්නේය. මේ සඳහා බලපෑ සන්නිවේදන වර්ගය වන්නේ,
   1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය
   2. ශ්‍රව්‍ය සන්නිවේදනයයි
   3. අවාචික සන්නිවේදනය
   4. අන්තර්පුද්ගල සන්නිවේදනය

17. පෝල් ඩී. මැසෙනියර්ගේ සරල සමීකරණයට අනුව ප්‍රවෘත්තියක විශ්වාසනීයත්වය ගොඩනැගීමට බලපාන සාධකයක් නොවන්නේ,
   1. නිවැරදි බව
   2. සංක්ෂිප්ත බව
   3. පැහැදිලි බව
   4. සමතුලිත බව

18. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ ප්‍රථම පුවත්පත වන්නේ,
   1. කලම්බු ජර්නල්
   2. ලංකා ලෝකය
   3. ලක්මිණි පහන
   4. සරසවි සඳරැස

19. සමතල මුද්‍රණය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   1. එක් මුද්‍රිත පිටපතක් මගින් පිටපත් ගණනාවක් ගන්නා ක්‍රියාවලියකි.
   2. ජලය හා තෙල් මිශ්‍ර නොවීමේ මූලධර්මය මත පදනම් වූ ක්‍රියාවලියකි.
   3. කඩදාසිය අකුරු මත තෙරපීමෙන් කරනු ලබන මුද්‍රණයකි.
   4. වර්ණ හතරක් පමණක් යොදා ගන්නා මුද්‍රණ ක්‍රමයකි.

20. ශ්‍රී ලංකා ගුවන්විදුලි සේවා තරංගමාලා බෙදාදීමේ කාර්යය සිදුකරනු ලබන්නේ,
   1. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයයි.
   2. ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිසමයි.
   3. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවයි.
   4. ජන මාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයයි.

21. පාසලේ උදෑසන රැස්වීමට සහභාගි වෙමින් සිටින අතරතුර සමාධිට පෙරදින රාත්‍රියෙහි රූපවාහිනියෙන් නැරඹූ ටෙලිනාට්‍යයක් සිහියට නැගුණි. ඇය තනිවම සිනාසෙනු දුටු රුවනි ඇයගෙන් ඊට හේතු විමසුවාය. මෙම සිදුවීම තුළ අන්තර්ගත සන්නිවේදන වර්ග පිළිවෙළින්,
   1. සමූහ, අන්තර්වර්තී, අන්තර් පුද්ගල, ජන
   2. අන්තර්වර්තී, ජන, අන්තර් පුද්ගල, සමූහ
   3. ජන, සමූහ, අන්තර් පුද්ගල, අන්තර්වර්තී
   4. සමූහ, ජන, අන්තර්වර්තී, අන්තර් පුද්ගල

22. ගුවන් විදුලි නාට්‍ය විකාශයක අන්තර්ගත විය හැකි සන්නිවේදන ස්වරූපයන් වන්නේ,
   1. වාචික, අවාචික, ශ්‍රව්‍ය, දෘශ්‍ය
   2. වාචික, දෘශ්‍ය, ශ්‍රව්‍ය, අවිධිමත්
   3. ශ්‍රව්‍ය, විධිමත්, වාචික, අවාචික
   4. විධිමත්, ශ්‍රව්‍ය, ලිඛිත, දෘශ්‍ය

23. සන්නිවේදනයේ මූලික කාර්යයක් නොවන්නේ, මින් කුමක්ද?
   1. සංවාද හා සාකච්ඡා
   2. ඒකාබද්ධතාව
   3. සංස්කෘතික ප්‍රගමනය
   4. සාක්ෂරතාව

24. යථාකාර රූපවාහිනී වැඩසටහන් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,
   1. සංස්කාරක වරයාගේ ඍජු මැදිහත්වීම සහිතය
   2. අනිවාර්ය පිටපත් රචනයක් මත සිදුවේ.
   3. නව ආරක රූපවාහිනි සංස්කෘතියක් හඳුන්වා දෙයි.
   4. අනෙක් වැඩසටහන් වලට සාපේක්ෂව අධික පිරිවැයකින් යුක්තය.

25. ලෝක රූපවාහිනී දිනය යෙදී ඇත්තේ,
   1. ජනවාරි 28
   2. නොවැම්බර් 21
   2. දෙසැම්බර් 12
   4. ජූලි 25

26. පැරණි මුද්‍රණ ශිල්පය සහ නූතන මුද්‍රණ ශිල්පයේ ආරම්භක රටවල් පිළිවෙලින් ගත් කළ,
   1. චීනය හා ජර්මනිය
   2. ප්‍රංශය හා ජර්මනිය
   3. ජර්මනිය හා චීනය
   4. චීනය හා ප්‍රංශය

27. රූපාක්ෂර හෝඩි සහිත රටවල් ඇතුළත් වරණය වන්නේ,
   1. ලංකාව, ඉන්දියාව, චීනය
   2. චීනය, ජපානය, කොරියාව
   3. ප්‍රංශය, චීනය, ලංකාව
   4. ඉන්දියාව, චීනය, කොරියාව

28. ඡායාරූපයක විභේදන බලය යනු,
   1. වර්ග අගලක් තුළ ඇති පික්සල් ප්‍රමාණයයි.
   2. ආලෝකය අනාවරණය කර ගැනීමය
   3. ක්ෂේත්‍ර ගැඹුර අඩු වැඩි කිරීමය
   4. පටල වේගයේ අඩු වැඩි බවයි.

29. රූපවාහිනී වැඩසටහනක් නිර්මාණාත්මක වශයෙන් නිම කිරීමට නායකත්වය ලබා දෙන්නේ,
   1. නිෂ්පාදක වරයාය
   2. අධ්‍යක්ෂක වරයාය
   3. නිවේදකයාය
   4. වේශනිරූපණ ශිල්පියාය

30. ශ්‍රී ලාංකික පුරවැසියෙකු සතු ලක්ෂණයක් නොවිය යුත්තේ,
   1. තම ආගම පමණක් උසස් කොට සැලකීම
   2. බදු ගෙවීම
   3. නීතිගරුක වීම
   4. ඡන්ද අයිතිය පාවිච්චි කිරීම

31. වැඩ ලෝකය සම්බන්ධයෙන් මාධ්‍යයෙන් ඉටුවිය යුතු වගකීමකි.
   1. රැකියා හිගය පිළිබඳ විවිධ මතවාද ඉදිරිපත් කිරීම
   2. වැඩ ලෝකයට ගැළපෙන ලෙස තමා සංවර්ධනය විය යුතු බවට තරුණ පිරිස දැනුවත් කිරීම.
   3. අධ්‍යාපනය වැඩ ලෝකයට ගළපා ගත යුතු බවට සමාජය කැළඹිල්ලට ලක් කිරීම
   4. රැකියා ලබා දීම රජයේ වගකීම ලෙස දක්වමින් කැරලි සංවිධානයට තරුණ පිරිස පොළඹවාලීම

32. අවාචික සන්නිවේදනයේ සමාජීය අවකාශයේ සිටින්නේ,
   1. නෑදැයින්
   2. ගනුදෙනු කරුවන්
   3. යහළුවන්
   4. දෙමව්පියන්

33. දෘෂ්ටියේ අඛණ්ඩතාව යන සිද්ධාන්තය පදනම් කරගෙන බිහි වූ මාධ්‍යය වන්නේ,
   1. ඡායාරූපය
   2. කැමරාව
   3. සිනමාව
   4. පුවත්පත

34. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලිය සඳහා භාවිතා කළ නොහැකි උපකරණය වන්නේ,
   1. බහු මාධ්‍ය ප්‍රක්ශේපන යන්ත්‍රය
   2. මුද්‍රණ යන්ත්‍රය
   3. ඩිජිටල් අනුපිටපත්කරණ යන්ත්‍රය
   4. ඡායා පිටපත්කරණ යන්ත්‍රය

35. හැම උද්වේගකර ආරංචියක්ම ප්‍රවෘත්තියකි නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

1. මිල්ටන් බ්‍රෂ් 2. පෝල් ඩී මැසනියර් 3. විල්බර් ශ්‍රාම් 4. චාර්ල්ස් ඇන්ඩර්සන් ඩානා

36. හැරල්ඩ් ඩී ලැස්වෙල්ගේ සන්නිවේදන සූත්‍රය මගින් හඳුන්වාදෙන සුවිශේෂ අංගය වන්නේ,

1. සන්දේශයයි 2. පෙළඹවීමය 3. බලපෑමයි 4. මාධ්‍යයයි

37. කණ්ඩායම් සන්නිවේදනය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. මුහුණට මුහුණලා සිටීම අවශ්‍යය. 2. නායකයෙක් සිටීමට ඉඩ ඇත.
3. පොදු අරමුණක් තිබීම වැදගත්ය 4. තාක්ෂණික උපකරණ භාවිතය අනවශ්‍යයි

38. සංවෘත පරිපථ රූපවාහිනී කැමරාවල අරමුණ වන්නේ,

1. පසුගිය වැඩසටහන් නැරඹීමේ පහසුකම් සැපයීමය.
2. සෘජුව නිවෙස් වෙත සේවා සැපයීමයි
3. දේශීය හා විදේශීය තොරතුරු ලබාදීමය
4. අභ්‍යන්තර හා බාහිර පරිසර සුපරීක්ෂණය

39. රාජ්‍ය මාධ්‍ය ආයතනයක් ලෙසින්ම ආරම්භ වූ ජනමාධ්‍ය ආයතනය,

1. ලේක් හවුස් ආයතනය 2. ස්වාධීන රූපවාහිනී ආයතනය
3. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව 4. විජය පුවපත් සමාගම

40. ඡායාරූපකරණයේ අනාවරණ ක්‍රියාවලියට අයත් කාර්යයක් වන්නේ,

1. ඡායාරූපයට හසුකර ගන්නා අරමුණ වඩා පැහැදිලි වන සේ කාචය සීරු මාරු කිරීම.
2. කාච විවරයේ හා ද්වාරයේ පිහිටීම නිසි පරිදි සකස් කොට ආලෝකය පාලනය කිරීම.
3. ඡායාරූපයට හසුකර ගන්නා වස්තුව තීරණය කිරීම.
4. රූප රාමුවට අයත් වස්තූන් නිසි පරිදි සංවිධානය කිරීම.

(1x40 = 40)

# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 11 ශ්‍රේණිය

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II **කාලය :** පැය 2

- පළමු ප්‍රශ්නය ඇතුළත්ව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

1. පාසලේ උදෑසන රැස්වීම පැවැත්වීම සඳහා මාධ්‍ය ඒකකයේ දායකත්වය ඉතා වැදගත් වන බව විදුහල්පතිතුමා තම උදෑසන රැස්වීමේ කතාවේදී ප්‍රකාශ කළේය.

    i. මෙම අවස්ථාව හා සම්බන්ධ සන්නිවේදන වර්ගය නම් කරන්න.
    ii. උදෑසන රැස්වීමේදී දැකගත හැකි නිර්වාචික සන්නිවේදන ක්‍රමෝපායන් 2ක් දක්වන්න.
    iii. විදුහල්පතිතුමාට තම කථාව සාර්ථක කරගැනීම සඳහා යොදා ගත හැකි උපක්‍රම 2ක් නම් කරන්න.
    iv. උදෑසන රැස්වීම සඳහා භාවිත කළ හැකි මයික්‍රෆෝන වර්ග 2ක් නම් කරන්න.
    v. උදෑසන රැස්වීමේදී පෙර පැවැත් වූ මාධ්‍ය තරගවල ජයග්‍රාහකයන්ට සහතිකපත් ප්‍රදානය කළේ නම් එම සහතිකපත් දිගුකාලයක් ආරක්ෂාකාරීව තබා ගැනීමට සිදුකළ යුත්තේ කුමක්ද?
    vi. ජයග්‍රාහකයන් සඳහා සහතික පත්වලට අමතරව අගනා විෂයානුබද්ධ පොත් පරිත්‍යාගයක්ද සිදුවිය. යුනෙස්කෝ අර්ථකථනයට අනුව පොතකට තිබිය යුතු අවම පිටු ගණන කීයද?
    vii. හදිසියේ සිදුවූ විදුලිය බිඳවැටීමක් නිසා උදෑසන රැස්වීම මද වේලාවකට නැවැත්වීමට සිදුවූයේ නම් එම අවස්ථාවේදී ඇති වූ බාධක වර්ගය නම් කරන්න.
    viii. උදෑසන රැස්වීම සඳහා අඛණ්ඩව ඉදිරිපත් කෙරෙන විශේෂාංගයක් ලෙස ''පාසල් පුවත්'' දැක්විය හැක. පාසල් ප්‍රවෘත්ති සඳහා තොරතුරු ලබාගත හැකි පුද්ගල මූලාශ්‍ර 2ක් නම් කරන්න.
    ix. ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක 2ක් නම් කරන්න.
    x. මාධ්‍ය සමාජය විසින් පලකෙරෙන පාසල් පුවත්පත සඳහා ලිපි ලබාදෙන ලෙස මෙහිදී සිසුන් දැනුවත් කෙරිණි. පාසල් පුවත්පතක් සැකසීමේදී අනුගමනය කළ යුතු ප්‍රායෝගික ක්‍රියාකාරකම් 2ක් නම් කරන්න. (ල. 2x 10 = 20)

02. i. ජනමාධ්‍යයේ මූලික වර්ග දෙක නම් කරන්න. (ල. 1)
    ii. පුවත්පතක ප්‍රධාන කර්තෘ සතු කාර්යයන් 2ක් දක්වන්න. (ල. 2)
    iii. ගුවන්විදුලි වැඩසටහන් ආකෘති 3ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 3)
    iv. ප්‍රවෘත්ති වාර්තාකරණය හා නිර්මාණාත්මක රචනයට අදාළ ආකෘති දෙක දක්වමින් සන්සන්දනාත්මකව පැහැදිලි කරන්න. (ල. 4)

03. i. ප්‍රාග් මුද්‍රිත මාධ්‍ය ස්වරූප දෙකක් නම් කරන්න. (ල. 1)
    ii. ඔෆ්සෙට් ලිතෝග්‍රැෆි ක්‍රමය සඳහා භාවිත වන මූලික වර්ණ හතර නම් කරන්න. (ල. 2)
    iii. කෙටියෙන් පහදන්න. (ල. 3)
        (අ) මාණ්ඩලික මාධ්‍යවේදීන්
        (ආ) ප්‍රාදේශීය මාධ්‍යවේදීන්
        (ඇ) පුරවැසි මාධ්‍යවේදීන්
    iv. නිශ්චල ඡායාරූප භාවිතය නිසා පුවත්පතකට ලැබෙන වාසි හතරක් පැහැදිලි කරන්න. (ල. 4)

04. i. කාර්යාලීය මාධ්‍ය ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන උපකරණ දෙකක් නම් කරන්න. (ල. 1)

ii. පුවත්පතෙහි ප්‍රමාණය අනුව වර්ග කෙරෙන ප්‍රධාන ප්‍රභේද දෙක දක්වා ඒ සඳහා උදාහරණ දෙක බැගින් සපයන්න. (ල. 2)

iii. ආයතනයක් තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන මූලික ආකාර තුන නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල. 3)

iv. ප්‍රක්ශේපනීය හා ප්‍රක්ශේපනීය නොවන මාධ්‍ය උපකරණයන්හි වාසි හා අවාසි දෙක බැගින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 4)

05. ''රචනාවක් ලිවීමට අවශ්‍ය තොරතුරු සොයමින් සිටි සඳුනිට ඒ සඳහා අවශ්‍ය පුවත්පත් ලිපියක් ලැබිණි. නමුත් මුද්‍රිත අකුරු මත තීන්ත තැවරී තිබූ නිසා එය කියවීමට බාධා ඇතිවිය.''

i. ඵලදායී ලේඛනයක තිබිය යුතු ලක්ෂණ 2ක් නම් කරන්න. (ල. 1)

ii. පුවත්පතක අන්තර්ගත ආකෘති 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2)

iii. පුවත්පත් ආයතනයකට විද්‍යුත් තැපැල් ගිණුමක් පවත්වාගෙන යාමේ ඇති වාසි 3ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 3)

iv. සන්නිවේදනයේ මූලික බාධක වර්ග 2 නම් කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 4)

06. "හැඟීම්, සිතුවිලි හා අදහස් අන්‍යයන් සමග හුවමාරු කර ගැනීම සන්නිවේදනයයි.''

i. සන්නිවේදනය බාධක පිළිබඳ අන්තර්ගත ආකෘතිය ඉදිරිපත් කළේ කවුරුන් විසින්ද? (ල. 1)

ii. ''සංජානනය'' කෙටියෙන් පහදන්න. (ල. 2)

iii. ද්විමාර්ගික සන්නිවේදන සූත්‍රය ඇඳ පැහැදිලි කරන්න. (ල. 3)

iv. සන්නිවේදන වර්ගීකරණය උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 4)

07. ''මාධ්‍ය අභිසාරිතාව යන්නෙහි සරල අදහස වන්නේ සියලු මාධ්‍ය එකට හමුවීම යන්නයි.''

i. මාධ්‍ය අභිසාරිතාව සඳහා මූලිකවන ප්‍රධාන සංරචකය කුමක්ද? (ල. 1)

ii. මාධ්‍ය අභිසාරිතාව නිසා ග්‍රාහකයාට සැලසී ඇති වාසි 2ක් විස්තර කරන්න. (ල. 2)

iii. දුරකථන භාවිතයේදී දෙපාර්ශ්වය විසින් පිළිපැදිය යුතු ආචාර ධර්ම 3ක් පැහැදිලි කරන්න (ල. 3)

iv. ජන සන්නිවේදනයේ ස්වභාවය කරුණු 4ක් ඇසුරින් විස්තර කරන්න. (ල. 4)